# මම දැන් ලොකු ළමියෙක්



සෙනුෂි නෙතුම්සා හේරත්

කෘතියේ නම - මම දැන් ලොකු ළමයෙක්

ප්‍රථම මුද්‍රණය - 2025.02.08

කතාව සහ චිත්‍ර - සෙනුෂි නෙතුම්සා හේරත්

කතෘගේ ලිපිනය - අංක 179/21,
පට්ටියකැලේ වත්ත,
අම්පිටිය

පාසල - ගෝතමී බාලිකා විදුහල

ශ්‍රේණිය - 4 ශ්‍රේණිය A

පරිගණක අක්ෂර හා පිටු සැකසුම : ඕෂධී එන්ටර්ප්‍රයිසස්,
2 G,
සිගෝ ප්ලාසා,
තලාතුඔය.

ISBN: 978-624-208-453-4

# පිදුම

**මා වෙනුවෙන් දුක් මහන්සි වී මුදල් උපයන**

**මගේ අප්පච්චිටත්,**

**මා පසුපසින් සිට මට ශක්තියක් වන**

**මගේ අම්මාටත්,**

**මෙම පොත ආදරයෙන් පුදමි.**



# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමුකරන

''**හෙරණගත්කරණී**'' ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධිර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර



එකොමත් එක කාලෙක
පුංචි ගැහැණු ළමයෙක්
හිටියා. එයාගේ නම සිඟිති.
ඇයට වයස අවුරුදු පහයි.

ඇයට සහෝදරයෙක් සිටියා.
ඔහුගේ නම ළකිඳු. ඔහුට වයස
අවුරුදු දහසයකි. සිඟිති හරිම දක්ෂයි. ඒ
වගේම ළකිඳුත් දක්ෂයි. ළකිඳු සිඟිතිට හරිම
ආදරෙයි. ඒ වගේම සිඟිතිත් අයියට හරිම
ආදරෙයි.



රෑ බෝ වුණා.

‘‘ හෙට සඳුදා.’’ සිඟිති සතුටින් කිව්වා.

‘‘හෙට නංගි පෙර පාසල් යන පළමු දවස’’ ළකිඳු කිව්වා.

සිඟිතිට ආඩම්බරයක් දැනුණා. හැමෝම සතුටින් නින්දට ගියා.

සිඟිති උදෑසන 5.30 වන විට පිබිදුනා.

''ඇයි පුතේ උදෙන්ම නැගට්ටේ ? ගිහින් නිදාගන්න'' අම්මා කිව්වා.

''මම දැන් ලොකු ළමයෙක්නෙ'' නංගි ආඩම්බරයෙන් පැවසුවා.

''හරි...හරි... මේ තේ එක ගිහින් අයියාට දෙන්නකෝ''

මව පැවසුවා.

සිඟිති තේ එක පරිස්සමෙන් අයියාට ගිහින් දුන්නා. අයියාට නංගි ගැන සතුටු හිතුණා.

''අපේ සිඟිති හපනෙක් නෙ.... හොඳ නංගි..'' අයියා කිව්වා.

නංගිට සතුටු හිතුණා. ඇයට ආඩම්බරයක් ද දැනුණා.



හැමෝම කෑම
මේසයේ ඉඳ
ගත්තා.
අම්මා සිඟිතිට
කෑම කැවීමට
සූදානම් වුණා.

‘‘මට කවන්න
ඕන නෑ අම්මේ.
මම දැන් ලොකුයිනේ.
මම දැන් තනියම කන්නම්.’’
සිඟිති කිව්වා.
ඉතින් අම්මා හා තාත්තා
සමඟ සිඟිති පෙර පාසල් ගියා.



සිඟිතිගේ ගුරුතුමිය හැමෝටම අකුරු කියා දුන්නා.
සිඟිති ලස්සනට අකුරු ලිව්වා. ගුරුතුමිය ඒ දැක සතුටු වුණා.
''සිඟිති දැන් ලස්සනට අකුරු ලියනවා''
ගුරුතුමිය කිව්වා.
''මම දැන් ලොකුයිනේ ටීචර්''
සිඟිති කිව්වා.

ගුරුතුමිය සිඟිතිගේ ඔලුව අතගෑවා.
සිඟිතිගේ ලස්සන අකුරු මුළු පන්තියටම පෙන්නුවා.

“දැන් විවේක කාලය. හැමෝම කෑම ඔක්කොම කන්න ඕනි. මම කෑම පෙට්ටිය බලනවා.” ගුරුතුමිය කිව්වා.



ළමයි අත සෝදා ආහාර ගැනීමට සූදානම් වුණා.
“ටීචර් මගේ වතුර බෝතලේ අරින්න බෑ.”
සඳුනි කිව්වා.

“ගේන්න මම ඇරලා දෙන්න.”
ගුරුතුමිය කිව්වා.
“මම ඇරලා දෙන්නම් ටීචර්.
මට පුළුවන්.” සිඟිති කිව්වා.
ගුරුතුමිය සිනාසුණා. සිඟිති සඳුනිගේ බෝතලය ඇරලා දුන්නා.



පාසල් අවසන් වී නංගි, අම්මා සහ තාත්තා සමඟ ගෙදර එන්න පටන් ගත්තා.

‘‘දුවේ බෑග් එක දෙන්න’’ අම්මා කිව්වා.

‘‘ඕනි නෑ අම්මේ, මට පුළුවන්’’


සිඟිති කිව්වා.

‘‘පුතේ ඔයාට අමාරු නැද්ද? ’’

අම්මා කිව්වා.

‘‘නෑ අම්මේ. මම දැන් ලොකුයිනේ.’’

සිඟිති කිව්වා.



තාත්තා සිඟිතිගේ අතින් අල්ලගත්තා.

"පාරේ වාහන එනවා දුවේ.

දකුණු පැත්තෙන් තමා අපි යන්න ඕනි."

තාත්තා කිව්වා.

"ඔව් තාත්තේ.

අපෙ ටීචත් කියලා දුන්නා"

සිඟිති කිව්වා.




"තාත්තේ, අයියාට පොතක් ගේන්න කිව්වා නේද?" සිගිති කිව්වා.

"ඔව්නේ දුවේ, ඔයාට මතක තිබුණා නේද? යමුකෝ එහෙනම්." තාත්තා කිව්වා.

"දුවේ ඔයාට පාට කරන්න පොතක් අරන් දෙන්නද?" අම්මා ඇසුවා.

"එපා අම්මා. මට අකුරු ලියන්න පොතක් අරන් දෙන්නකෝ. මම දැන් ලොකුයිනේ." සිගිති කිව්වා.

අම්මා තාත්තා දෙස බලා සිනාසුණා.

බසයට නැගුණු තිදෙනා ආසනයක අසුන් ගත්තා.



“ම..හ..නු..ව..ර.. අම්මේ බස්
එකේ ලියලා තියෙන්නේ
මහනුවර කියලා නේද?”
සිඟිති ඇසුවා.

“ආ..නේ.. ඔයාට දැන් වචන
කියවන්නත් පුළුවන්ද දුවේ?” අම්මා ඇසුවා.

“ඔව් අම්මේ. මම දැන් ලොකු ළමයෙක් නෙ.” සිඟිති කිව්වා.

“ඔව් තමා අපේ සිඟිති දැන් ලොකු ළමයෙක්නේ” තාත්තා සතුටින් කිව්වා.




සෙනුෂි නෙතුම්සා හේරත්

4 ශ්‍රේණිය A

ගෝතමී බාලිකා විද්‍යාලය

මහනුවර


පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළි දැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව (2014) වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්විමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දූරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලූ ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධිකාරක,

සෙනෙවිරත්න මහලේකම්


ISBN: 978-624-208-453-4